ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව |
| දිනය | 2012.06.01 |

**නඩු පවරා අයකරගත් මුදල්**

**සේවක අර්ථසාධක අරමුදලේ ගිණුම්වලට බැර කිරීම**

කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් නඩු පවරා අය කර ගන්නා ලද රුපියල් කෝටි 345 ක් සාමාජිකයින්ගේ ගිණුම්වලට බැර කර නොමැත යනුවෙන් 2012 මැයි මස 28 සහ 29 වන දිනයන්හි දී ඇතැම් පුවත්පත්වල පළ වූ ප්‍රකාශය සම්බන්ධයෙන් පැහැදිලි කිරීම මෙම පුවත්පත් නිවේදනයේ අරමුණයි.

ඇතැම් සේවායතන සාමාජිකයන්ගේ දායක මුදල් ගෙවීම පැහැර හරින අවස්ථා වලදී, එම හිඟ මුදල අයකර ගැනීමට කම්කරු කොමසාරිස්වරයා නීති මගින් කටයුතු කරනු ඇත. එසේ පැහැර හැර ඇති දායක මුදල් ගෙවීම සඳහා සේවායතන වෙත අධිකරණ නියෝග ලැබුණු පසු බොහෝ අවස්ථාවලදී එම හිඟ මුදල් වාරික වශයෙන් ගෙවීමට අදාළ ආයතන අධිකරණයෙන් අනුමැතිය ලබා ගනී. සමහර විට, ඒ සඳහා ලබා ගන්නා සහන කාලය වසර 5 ක් හෝ 10 ක් වන අවස්ථා ද ඇත. මෙසේ වාරික වශයෙන් ලැබෙන මුදල, අය වීමට නියමිත හිඟ මුදල සම්පූර්ණ වන තෙක්, කම්කරු කොමසාරිස් ගිණුමේ රඳවා ගනු ලැබේ. සියලු වාරික ගෙවා නිම වීමෙන් අනතුරුව, එක් එක් සාමාජිකයා සඳහා බැර කළ යුතු මුදල සඳහන් "සී" වාර්තා කම්කරු දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවට යොමු කරනු ලැබේ. ඊට පසු එම වාරික මුදල් අදාළ පොලී මුදල් ද සමඟ එකී සාමාජිකයින්ගේ කේවල ගිණුම් වලට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. එබැවින් නඩු මගින් අයකර ගනු ලබන සියළුම මුදල්, "සී" වාර්තා ලැබීමෙන් අනතුරුව සාමාජික ගිණුම්වලට බැර කෙරෙනු ඇත. තවද, සේවායයා දායක මුදල් මාස්පතා එවනු ලබන විට, සේවායතන විසින් "සී/සී3" සඳහන් වන

වටිනාකමට සමාන මුදලක් එවා නොමැති අවස්ථාවලදී හෝ ඌණතා සහිත හෝ වැරදි "සී/සී3" වාර්තා ඉදිරිපත් කර ඇති අවස්ථාවලදී, එකී වාර්තා ගිණුම්ගත කිරීමට අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවට නොහැකි වනු ඇත. එවිට, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත අනුව, අදාළ දායක මුදල් අඩු වැඩි දායක මුදල් ගිණුමට බැර කරනු ලැබේ. ඒ අතර, හිඟ මුදල් නොපමාව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව වෙත එවන ලෙස හෝ "සී/සී3" වාර්තා නිවැරදි කර එවන ලෙස සේවායතන වෙත දන්වා යවනු ලැබේ. මේ ආකාරයට, සේවායතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අදාළ නිවැරදි කිරීම් සිදු කර හිඟ දායක මුදල් එවන තෙක් අඩු වැඩි දායක මුදල් ගිණුමේ එකී මුදල් රඳවා ගනු ලැබේ. එමෙන්ම, එම තොරතුරු හෝ මුදල් එවූ වහාම සේවක අර්ථසාධක අරමුදල් පනත අනුව නියමිත පොලී මුදල් ද සමඟ එම දායක මුදල් සාමාජිකයින්ගේ ගිණුම්වලට බැර කිරීම කටයුතු කරනු ලැබේ. මෙලෙස සාමාජිකයන්ගේ ගිණුම්වලට බැර වන තෙක් කාලය තුළදී ද, මෙම ගිණුම් දෙකෙහිම පවතින මුදල් නිසි පරිදි ආයෝජනය කර ආදායම් උපයා ගනු ලබන අතර, එම මුදල් ගිණුම්ගත කරන අවස්ථාවේදී නියමිත පොලී මුදල් ද සමඟ සාමාජිකයින්ගේ කේවල ගිණුම්වලට බැර කිරීම සිදු වේ.

ඒ ආකාරයට, 2010.12.31 දිනට කම්කරු කොමසාරිස් ගිණුමේ පැවැති ශේෂයෙන් රු.කෝටි 65 ක් ද, එදිනට අඩු වැඩි දායක මුදල් ගිණුමේ පැවති ශේෂයෙන් රු.කෝටි 24 ක් ද, මේ වනවිටත් සාමාජික ගිණුම් වලට බැර කිරීමට කටයුතු කර ඇත. ඉතිරි මුදලත්, නීත්‍යානුකූලව සාමාජිකයින්ගේ ගිණුම් වලට බැර කිරීමට ඉදිරි කාලයේ දී කටයුතු කරනු ලැබේ. එහෙයින් පුවත් පතෙහි සඳහන් ආකාරයට මෙහිදී කිසිදු වැරැද්දක් සිදු වී නැති බව සේවක අර්ථසාධක අරමුදල පවසනු ඇත.